

# දැන්වීමයි

දුහුල් රන් පටින් බැඳ - කාල යාත්‍රයන්.. වීදි පැන්නූ...
අනේක විධ වස් දොස් නැසූ - බෙර, හේවිසි හොරණෑ, පෝරු..
සකල විධ සංස්කෘතික අංගයන්ගෙන් - පණ පෙවූ..
සුවඳ පැන් නැහැවූ - ප්‍රේමයේ මල් වියකම්..

ඔපලූ...

**මුද්ද නැති වී ඇත...**

නිහාල් රුවන්දෙණිය

# ඩොලර් ලෙව කෑම

රස කැවිල්ලකින් ගෙදරට ලැබුණු
පුංචි කොටසක් ඔතාගෙන
ගැබ්බර මිතුරියට දෙන්නට
බස්රියේ එල්ලී වැඩට යනවිට
සිහියට නැගෙයි නිතැනින්
වැඩිවිය පැමිණි පියුන්ගේ දුවට
මුදලක් යැවිය යුතුයයි
ගවුමක් මහ ගන්නට.

කර -- කර ගෑ විදුලි පංකා
දූලි පිරි කාමර නැති
පතිරූප දේසයක
මාරුවී ඉන්නෙමි
වේවැල් පුටුවෙන්
කැරකෙන පුටුවට.

ලෙන්ගතුකම සිඳුණු
වාලුකා කතරකි වැඩබිම.
පඩිපත පමණි - එකම මංගල කරුණ.
අහෝ ! රුපියලට වඩා
ඩොලරය මොනතරම් වටීද?

ශ්‍රියානි පෙරේරා

# පහන් වැට

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

# හිමි කුමරු වඩින තුරා

*බලා සිටියෙමි කප් හසක් කල්*
*පැළඳ පරසතු මදාරා*
*වඩින තුරු මනු රජ කුලෙන්*
*ඇත් අසුන් සහසක් පිරි වරා*
*දෑස සේදුණු උණු පැණින්*
*දොවන්නට නල කුබර පා*

*සක් හඬින් බෙර නද මැදින්*
*අතැගිලි බඳින්නට රන් හුයෙන්*
*පසඟතුරු නද ගී සිලෝ මැද*
*යොහොඹු යහනට යන රිසින්*
*දුහුල් සළු මැද පුද දෙවන්නට*
*බිඟුන් හඬ නොඇසූ සුපුල්*

*වසත් සමයේ සිහිල් නල වැල්*
*මියුරු ගී රහසෙන් ගයා*
*සදෙස් කවියක් කුමරු වෙත*
*ගෙන කෙවිලි කිරිලිය දුර ගියා*
*සැදෑ සමයට ඉසිඹුලන්නට*
*සහසකර අවරට ගියා*

සමන්ති නාමරත්න
ග්ලෙන්රෝයි

# ගම්බද අරුණු

බොල් පිණි තණ මතින් දුවලා ඇල    ඉවුරේ
එගොඩට යන්න ආසයි උණබට    පහුරේ
මහ දිය කඳින් පිරී ගැඹුරත ඇති    සයුරේ
සුව නැත, ඇලදොලෙහි දිය සිහිලස    ඉතිරේ

ඇහිඳං කන්න මී අඹයක් කිරි    වැදුනූ
රසකර බලන්නට කජු පුහුලන්    පැහුනූ
ගහේ ඉදුනු වැල මදුලකබපැණි    පිරුණු
ආසයි දකින්නට යලි ගම්බද    අරුණු

ලඟ ඇල පාර දිය කඩිති හා විල්    වල
තිත්තයි පැටව් පිහිනති පොකුණු මං    වල
කහ සමනලුන් එන විට රොනට මල්    වල
පැටලී මියැති සමහරු මකුළු දැල්    වල

සිරිපොද වැසි කලට ඉගිලෙන රෑන    මෙරූ
ගෙඹඩිත්තන්ට රස අහරකි කුසට    පිරූ
රැස් කන කනමැදිරි රෑ ඝන අඳුර    මැරූ
නිල් ආකාසෙ සිරිගති තරු යාය    පිරූ

වැටකේ පඳුරු බෝවිටියා ගස්    අස්සේ
ඉඳහිට කල් ගෙවා දං ගහ උඩ    මැස්සේ
ගස් උඩ හැංගෙමින් මොර සූරන    වැස්සේ
කෙලි දෙල්ලෙන් ගෙවාලූ කාලය    රිස්සේ

ගෙට ආ සැනින් අප හැම ඉස්කෝලෙ    ඇරී
විල්මත සුපිපි මල් නෙලුවෙමු මඩෙහි    එරී
දල්වා පහන් නෙක නෙක දැ සුවඳ    පිරී
සෙල්ලම් ගෙවල් තුල මැව්හැටි වෙසඟ    සිරී

බැසිල් ඇන්තනී - ඩුබායි

# මවකගෙ සිතුවිලි

හිරු ගිනි ගත් මද්දහනක
හිමි තනි වූ එක් මොහොතක
නොසිතු විලස මරු ඇවිදින්
අහිමි කළා හිමි සඳ මට
රැකුමට මගෙ පුංචි පැටව්
හෙළූ දහදිය කඳුළු සුසුම
විඳි අපමණ දුක් කරදර
සිහි වෙයි මට අද තාමත්
වැඩිමල් පුතු සහ ලේලිය
විසුවත් බොහෝ දුර ඈතක
කරට අරන් පවුලේ බර
ඉටු කරලයි යුතුකම හැම
රට හැර ගිය මගෙ දියණිය
අවැසි වුණත් හැම දින මට
දියුණ පතා ඔවුනට මම
සැනසෙමි මම දුක යට කර
පවුලෙ හැමගෙ ලෙඩට දුකට
ගෙදර දොරේ හැම වැඩකට
මට සිටිනා එකම සවිය
පොඩි පුතු පමණකි අද මට
මවබිම හැර යමි දවසක
පුතේ නුඹත් ගියොත් එතෙර
අසරණ වන අප ගැන
කා හට හැකි වෙද බලන්න.



කාන්ති සිල්වා
කැන්බරා

# සිතුවිලි

*සුවහසක්*
*සිතුවිලි*
*නැගෙයි*
*ජල*
*තරඟ සේ*
*සුවහසක්*
*සිතුවිලි*
*බිඳෙයි*
*ඒ*
*සරැළි සේ*
*නුඹ*
*රැඳෙයි*
*එහි*
*සිතුවිල්ල සේ*
-th-

# කුකුළෙකුගේ අඳෝනාව

පෙර අත්බවේ මා කල පව් පල    දීලා
මා ඉපදුණා මේ ලොව කුකුළෙකු    වීලා
ඇති දැඩි කළා මිනිසෙක් මා කොටු    කරලා
ඇඟපත හැදුවා මට හොඳ කෑමත්    දීලා

දැන් හොඳ ගාණකට කුකුළා ඇවිත්    ඇත
කියමින් අයිතිකරු පිරිමදිනවා    අත
දුටු මට වැටහුණා දැන් ගැලවුමක්    නැත
වැඩිකල් නොගොස් මගෙ පණ නල නසනු    ඇත

ඇයි මිනිසුනේ මා මරලා දන්    දෙන්නේ
පර පණ නසා කෙලෙසද නිවනට    යන්නේ
මගෙ ජීවිතය උදුරා ගෙන දන්    දෙන්නේ
එය සොරකමක් බව නැතිදෝ    වැටහෙන්නේ

මාව මරා ගත් මස් නෙව දන්    දුන්නේ
මගෙ මස් වලින් නොව ඔබ දිව    පිනවන්නේ
ඒ ගැන කිසි කෙනෙක් නැහැ නොවැ    පවසන්නේ
මගෙ මස් කාලා ඇයි මට පිං නොම    දෙන්නේ

ධර්මවර්ධන රණසිංහ

# කිවිසුරුවන් දුහුනන්ට

විය පත් වළා රොද
සිකර මුදුනත දවසැර
වසත් වන පිය සරන
පවන් හා මුසුප්පුව
එවා චන්ඩ මාරුත
අකල් මහ අසනි වැසි
රිදවන්න දරන තැත
සුහුඹුල් ඇල් පවන

ර් ඒ ඩෝසන් ප්‍රීති

කියවන්න... ලියන්න...
තොරතුරු දැන ගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.